TH 872

FACULTY OF GRADUATE STUDIES
RECEIVED
04 APR 2014
UNIVERSITY OF KELANIYA

# පුවත්පත් කාටූන් චිත්‍රවලින් හෙළිවන ශ්‍රී ලංකාවේ දේශපාලන, ආර්ථික හා සාමාජික තත්ත්වය

එල්. ඒ. ඩී. කරුණාදාස
**Ph.D/ Mco/ 97/ 01**

කැලණිය විශ්වවිද්‍යාලයේ සමාජීය විද්‍යා පීඨයේ ජන සන්නිවේදනය පිළිබඳ දර්ශනසූරි පර්යේෂණ උපාධිය සඳහා ඉදිරිපත් කරන ලදි.

2013 ඔක්තෝබර්

| | |
|---|---|
| ප්‍රවේශ අංකය: | 872 |
| වර්ග අංකය: | |

## සංක්ෂිප්තය

පුවත්පත් කලාවේ දියුණුවත් සමග, පාඨක රුචිය අභිවර්ධන සඳහා, එක් වූ විවිධාංග අතර පුවත්පත් කාටූන් චිත්‍රය කාලීන ගැඹුරු දේශපාලනික අරුත් පාඨකයා වෙත සන්නිවේදන කරන, උපහාසය මුසු හාස්‍යෝත්පාදක කලාවකි.

දෛනික පුවත් හා බැඳුණු දේශපාලන කාටූන් චිත්‍ර පාඨක ජන විඥානය විකසිත කර ජනමත බිහිකරලීමට සමත් වී තිබේ. ශ්‍රී ලාංකේය දේශපාලනය හා ආර්ථිකයත් ඒහා සබැඳි සමාජයත් පිළිබඳ යථාර්ථවත් ප්‍රතිබිම්බයක් දක ගත හැකි විය. එම ප්‍රයත්නයේ දී ශ්‍රී ලංකාව අධිරාජ්‍යවාදීන්ගෙන් නිදහස් වී ස්වරාජ්‍ය තත්ත්වයට පත්වන සැටි ද, ඉන්පසු රාජ්‍ය පාලනයේ සිදු වූ විපර්යාසයන් ද, ආර්ථිකමය සංවර්ධන ක්‍රියාවලිය ද, ඒ මගින් සිදුවන සමාජීය හා සංස්කෘතිකමය තත්ත්වයන් ද, ශ්‍රී ලාංකික පුවත්පත් කාටූන් චිත්‍ර ශිල්පීහු සිය විමර්ශනයට ලක්කර නිර්මාණශීලී ව ඉදිරිපත් කළහ.

වර්ගීකරණයට භාජනය කරගත් කාටූන් චිත්‍ර සියල්ල විශ්ලේෂණයේ දී සමකාලීන සත්‍ය මූලාශ්‍රයන් හා සංසන්දනය කර බලමින් සත්‍යෙක්ෂණයට භාජනය කෙරිණි. පුවත්පත් කාටූන් චිත්‍ර සන්නිවේදනයෙහි අන්තර්ගත වන පණිවුඩයෙහි පක්ෂග්‍රාහිත්වයක් තිබේ ද? කොතරම් පුද්ගලබද්ධවේ ද? යථාර්ථවත් ද? සත්‍යය විකෘතිකර තිබේ ද? පුද්ගල ප්‍රතිරූප මැවීමට උත්සාහ කර තිබේ ද? ආදී කරුණු මෙහි දී විමසුමට ලක් කෙරිණි. කාටූන් චිත්‍ර ශිල්පියාගේ විඥානය හා අත්දැකීම් පසුතලය සැකසෙන්නේ තමා සේවය කරන පුවත්පතේ ස්වාමි පක්ෂයේ මතවලට අනුකූලව ය. පුවත්පත් හිමිකාර පක්ෂය සිය පුවත්පත් මගින් දේශපාලනයක යෙදුණි. මේ අනුව කාටූන් චිත්‍රය නිර්මාණය වන්නේ පුවත්පතේ මතයක් ලෙසිනි.

ජාතික ගැටලුව, ශ්‍රී ලංකාවේ වාමාංශික ව්‍යාපාරය විධායක ජනාධිපති ක්‍රමය, ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තිය, ශ්‍රී ලංකාවේ දේශපාලනයේ විවිධ ක්‍රියාකාරකම් යන මාතෘකා යටතේ පළ වූ කාටූන් චිත්‍ර විශ්ලේෂණය ශ්‍රී ලාංකික දේශපාලනයේ බොහෝ ඓතිහාසික වැදගත් සිද්ධි විමර්ශනයට ලක් වී තිබේ.

වැවිලි ආර්ථිකය, දේශීය ආර්ථිකය, ජීවන වියදම, සංවර්ධනය, ආවෘත හා විවෘත ආර්ථික ක්‍රමය, අයවැය ලේඛනය ආදී මාතෘකා මගින් පුවත්පත් කාටූන් ශිල්පියා විවරණය කළ ශ්‍රී ලංකාවේ ආර්ථික තත්ත්වය විමර්ශනය කර තිබේ.

රටේ සමකාලීන දේශපාලන හා ආර්ථික තත්ත්වයන්ට අනුව සමාජ තත්ත්වය ද නිර්මාණය වී තිබේ. පුවත්පත් වාරණය හා මාධ්‍ය නිදහස, ජනමාධ්‍ය හා ආචාර ධර්ම, අධ්‍යාපනය හා සමාජය, භීෂණ යුගය ආදී මාතෘකා මගින් පුවත්පත් කාටූන් ශිල්පියාගේ සමකාලීන සමාජ තත්ත්ව විග්‍රහය කර තිබේ.

රටේ පැවති සමකාලීන දේශපාලන ආර්ථික හා සමාජ තත්ත්වය විමර්ශනයක දී පුවත්පත් කාටූන් චිත්‍ර මගින් ද අවබෝධයක් ලද හැකි බව මෙම පර්යේෂණයේ දී අනාවරණය කරගත හැකි විය.

මෙම අධ්‍යයනයේ දී අනාවරණය වූ අනෙක් වැදගත් කරුණක් නම්, පුවත්පත් දේශපාලන ඇතැම් කාටූන් චිත්‍ර මූලාශ්‍රයාගත තොරතුරු සමග නොසැසඳෙන බවයි.

සෑම පුවත්පතකටම මෙන්ම සෑම කාටූන් ශිල්පියෙකුටමත් ස්වකීයමය වූ දේශපාලන දෘෂ්ටියක් තිබේ. මෙහි දී කාටූන් ශිල්පියාට මධ්‍යස්ථ චින්තනයක පිහිටිය හැකි නම් ඔහුගේ නිර්මාණය වඩාත් විශ්වසනීය වනු ඇත. එහෙත් කාටූන් චිත්‍රයේ සන්නිවේදනය සම්පූර්ණ අසත්‍ය ම නොවේ. කාටූන් චිත්‍රය පාඨකයා ආකර්ෂණය කරන ප්‍රබල සන්නිවේදන මාර්ගයක් බව අවබෝධ විය. පුවත්පත් සමාගම් අයිතිකාර ස්වාමිවරුන්ගේ දේශපාලන පක්ෂග්‍රාහිත්වය කාටූන් චිත්‍රයට බලපෑම් නොකරන දිනක කාටූන් ශිල්පීන් ස්වඅභිමතයට අනුව උසස් නිර්මාණබිහි කරනු ඇත.

මුඛ්‍ය පදඃ කාටූන් චිත්‍රය, ජන සන්නිවේදනය, පාඨකයා, පුවත්පත් කලාව, සදාචාරය,